ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் திணைக்களம்
LAND COMMISSIONER'S DEPARTMENT

ෆැක්ස් / பெக்ஸ் / Fax : - - 29

නො.7, ග්‍රෙගරි මාවත ,කොළඹ 07
இல 7, கிரகரிஸ் மாவத்தை, கொழும்பு 07
No.7 , Gregory's Avenue, Colombo 07

ඊමේල් / ஈ-மெயில் / E-mail : Lan[illegible]@sltnet.lk

මගේ අංකය / எனது இல / MY NO : 5/2/6/චක්‍රලේඛ(1)
ඔබේ අංකය / உமது இல / YOUR NO :
දිනය / திகதி / DATE : 2005.01.18

චක්‍රලේඛ අංක.2005/01,

සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත,

## රජයේ ඉඩම් බෙදාදීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් සිදුවන අක්‍රමිකතා

රජයේ ඉඩම් මහජනයාට බෙදා දීමේදී හා පරිපාලනය කිරීමේදී ප්‍රාදේශීය ලේකම් වරුන් විසින් විනිවිද භාවය ආරක්ෂා නොවන ආකාරයට හා නීතියට එකඟ නොවන ආකාරයට කටයුතු කරමින් අක්‍රමිකතාවන් සිදුකරන බැවින් එම තත්ත්වය වහාම නැවැත්වීම පිණිස අතිගරු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු ගරු අමාත්‍ය තුමා, සියළුම පළාත් ආණ්ඩුකාර තුමන්ලා, සියළුම පළාත් ප්‍රධාන අමාත්‍යවරුන්ද , රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු , කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග යන අමාත්‍යාංශ වල ලේකම් වරුන් හා මා වෙතද පිටපත් සහිතව කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග ගරු අමාත්‍ය තුමා අමතා ඇති අංක.පීඑම්ඩී/එල්/18 - 2004 හා 2004.12.07 දිනැති ලිපියෙන් ඒ සඳහා අදාළ උපදෙස් හා නියෝග නිකුත් කරන ලෙසට දැනුම් දී ඇත.

මෙම ලිපියෙන් තවදුරටත් අතිගරු ජනාධිපති තුමිය අවධාරණය කර ඇත්තේ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ රජයේ ඉඩම් සම්බන්ධව රාජකාරි කරන ඕනෑම නිළධාරියෙක් අධීක්ෂණය කිරීමේ හා මෙහෙයවීමේ බලය ඉඩම් කොමසාරිස් වරයා සතු වන අතර ඒවාට පටහැනිව කටයුතු කිරීමේ බලයක් ප්‍රාදේශීය ලේකම් වරුන්ට නොමැති බැවින් කලින් කලට ඉඩම් කොමසාරිස් වරයා නිකුත් කරන උපදෙස් හා නියෝග ප්‍රාදේශීය ලේකම් වරුන් පිළිපැදිය යුතු බවය.

රජයේ ඉඩම් බෙදාදීමේදී විනිවිදභාවය ආරක්ෂා කිරීම සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේත්, ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේත්, ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනත යටතේත්, විධිමත් ක්‍රියාමාර්ගයක්(ඉඩම් කච්චේරි ක්‍රමය) මැනවින් හඳුන්වා දී ඇත. එහෙත් එම පනත් වලින් පැහැදිළි කර ඇති පරිදි නියමිත ක්‍රියාමාර්ගයන් අනුගමනය නොකර ඉඩම් කච්චේරි පැවැත්වීම නිසා අක්‍රමිකතා සිදු වේ. මීට අමතරව කිසිදු ඉඩමකට ස්ථිර බලපත්‍රයක් පසුව ලබාදීමේ පදනම මත වාර්ෂික බලපත්‍ර නිකුත් නොකළයුතු බව මගේ අංක.5/10/මූලික හා 1987.03.09 දිනැති චක්‍රලේඛයෙන් පැහැදිළි ව උපදෙස් දී ඇති අතර එම චක්‍ර ලේඛය මේ දක්වා වලංගුව පවතී. එහෙත් ඊට පටහැනිව යමින් බොහෝ අවස්ථාවලදී පුද්ගලයන්ට වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම තවදුරටත් ප්‍රාදේශීය ලේකම් වරුන් විසින් සිදු කරන බව පැහැදිළිව පෙනී ගොස් තිබේ. මෙම කරුණ ගැනද අතිගරු ජනාධිපති තුමිය විසින් එවා ඇති ලිපියෙන් අවධාරණය කර ඇත. එමෙන්ම ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ උරුමකරුවන් සඳහා ඉඩම් පවරාදීමේදී පනතේ විධිවිධානයන්ට පටහැනිව සිදුකර ඇති අක්‍රමිකතා පිළිබඳව මෙම කාර්යාලයටද විශාල වශයෙන් වාර්තා වී ඇත.

රජයේ ඉඩම් කළමණාකරණයේදී ඉඩම් කොමසාරිස් වරයා වෙත පැවරී ඇති බලතල හා ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත පැවරී ඇති බලතල හා ක්‍රියා කළයුතු ආකාරය පිළිබඳව සඳහන් ඉඩම් සංවර්ධන ආඥා පනතේ 4 වන වගන්තිය, රජයේ ඉඩම් ආඥා පනතේ 90,91 වගන්ති හා ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනතේ 17 සහ 20 වන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

කාර්යාලය / பொது / General 677166 | ආයතන / நிர்வாகம் / Establishment 671173 | ගිණුම් / கணக்கு / Accounts 675574 | ඉඩම් / காணி / Land 675576 | සංවර්ධන / அபிவிருத்தி / Development

CamScanner

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයෙන් පසු පළාත් සභා පිහිටුවන ලද අතර ඒ අද අදාළ බලතල පැවරීම සඳහා නීතිගත කරන ලද 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගි විධිවිධාන) පනතේ 2 (1) "ආ" යටතේ පළාත් ඉඩම් කොමසාරිස් වරයාට එම පළාත තුළ රජයේ ඉඩ සම්බන්ධ කටයුතු කිරීමේ බලතල හිමිවේ. ඊට අතිරේකව ඒ සෑම පළාත් ඉඩම් කොමසාරිස් වරයෙකු රජයේ අතිරේක ඉඩම් කොමසාරිස් වරයෙක් වශයෙන්ද පත්කර ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර ඇත. ඒ අනුව ඉඩම් කොමසාරිස් වරයා සතු බලතල අදාළ පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ බලතල පළාත් ඉඩ කොමසාරිස් වෙතද පැවර ඇති බැව් පෙන්නා දෙනු කැමැත්තෙමි.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට බලතල විමධ්‍යගත කිරීම සඳහා පනවන ලද 1992 අංක 5 දරණ බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම් වරයන්) පනතේ 4 වන වගන්තිය යටතේ ඉඩම් පරිපාලනය අදාළ දිසාපති වරුන් වෙත පැවර තුබූ බලතල ප්‍රාදේශීය ලේකම් වරුන් වෙතද පැවර ඇත.

විශේෂයෙන් අතිගරු ජනාධිපති තුමියගේ ඉහත ලිපියේ සඳහන් වන පරිදි රජයේ ඉඩම් බැහැ කිරීමේදී විනිවිද භාවය ආරක්ෂා වන පරිදි කටයුතු කිරීමටත්, ඉහත දක්වා ඇති පරිදි වාර්ෂික බලප මත ඉඩම් බැහැර කිරීම වහාම අත්හිටුවීමටත් , කටයුතු කරන්න. යම් අවස්ථාවක විශේෂ හේතුන් මත වාර්ෂික අවසර පත්‍රයක් නිකුත් කළයුතු වන්නේ නම් ඒ සඳහා අදාළ පරිදි මගේ හෝ පළාත් ඉඩ කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතුය. ඉහත තත්ත්වය යටතේ රජයේ ඉඩම් කළමණාකරණය අදාළ වන අණපනත් වල ඇති විධිවිධානයන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමට වගබලා ගන්නා ලෙ මෙයින් අවධාරණය කරමි.

එස්.ජේ.පතිරණ,<br>
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්.

1 ජනාධිපති ලේකම්,

2 ලේකම්, කෘෂිකර්ම,පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

3 ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

4 සියළුම දිස්ත්‍රික් ලේකම් වරුන්,

5 සියළුම පළාත් ඉඩම් කොමසාරිස් වරුන්,

6 සියළුම නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් වරුන් / සහකාර ඉඩම් කොමසාරිස් වරුන්.

ඉ/18.